## පළමුවන කියැවීම

ඉසයියස් 35:1-6, 10

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"දෙවියන් වහන්සේ ම ඔබ ගළවන පිණිස වඩින සේක."**

වනය ද වියළි දේශය ද ප්‍රීති වන්නෝ ය; කාන්තාරය ප්‍රීතිමත් වී සෙව්වන්දි මෙන් මල් දරන්නේ ය. එය ප්‍රීතියෙන් ගී හඬ නගන්නේ ය. ලෙබනොන් කන්ද මෙන් එය පියකරු වන්නේ ය; කර්මෙල් හා ශාරොන් කෙත් මෙන් සාරවත් වන්නේ ය; සමිඳුන්ගේ තේජාලංකාරය ද එතුමන්ගේ මහ බල මහිමය ද සියල්ලෝ දකින්නෝ ය. බෙලහීන අත් බලවත්කර, වෙවුළන දණ හිස් ශක්තිමත් කරන්න; බියසුලු සිත් ඇත්තන්ට මෙසේ කියන්න; "බිය නොවී දිරි ගන්න; දෙවිඳාණෝ ඔබ මුදන පිණිසත් ඔබේ සතුරන්ගෙන් පළිගන්න පිණිසත් වඩින සේක." අන්ධයන්ගේ ඇස් පැහැදෙන්නේ ය. බිහිරන්ගේ කන් ඇරෙන්නේ ය. කොර අය මුවන් මෙන් දුව පනින්නෝ ය. ගොළු අය ප්‍රීතියෙන් ගී ගයන්නෝ ය. කාන්තාරයෙන් ජලධාරා ගලා එන්නේ ය. මරුකතරෙන් ඇල දොළවල් බිඳී එන්නේ ය. ගැළවීම ලැබූ ඔව්හු ප්‍රීති ඝෝෂා පවත්වමින් සතුටු සිතින් පිනා යමින් ජෙරුසලමට පැමිණෙති. දුකින් හා දොම්නසින් මිදී සදහට ම ප්‍රීති වෙමින් ඔව්හු එහි වෙසෙති.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තොත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 146:6-10

පිළිතුර: දෙවිඳාණෝ අප මුදන පිණිස වඩින සේක.

ගීය: සමිඳාණෝ සදාකල් ම විශ්වාසී ව සිටින සේක. සමිඳාණෝ පීඩා විඳින්නන්ට යුක්තිය ඉටු කර දෙන සේක; සාගිනි වූවන්ට ආහාර දෙන සේක; එතුමාණෝ සිරකරුවන් මුදන සේක.

අන්ධයන්ගේ ඇස් පහදන සේක; වැටී ගියවුන් නගා සිටුවන සේක; සමිඳාණෝ දමිටුන්ට ප්‍රේම කරන සේක. විදේශීන් ආරක්ෂා කරන සේක; අනාථයන්ට හා වැන්දඹුවන්ට උපකාර කරන සේක; එහෙත්, දුදනාගේ යෝජනා සුන් කරන සේක.

සමිඳාණෝ සදහට ම රජකම් කරන සේක. එම්බා සියොන් නගරය! ඔබේ සමිඳාණෝ සියලු පරම්පරා දක්වා රජකම් කරන සේක. සමිඳුන්ට ප්‍රශංසා වේ වා!

## දෙවන කියැවීම

ජාකොබ් 5:7-10

ශුද්ධ වූ ජාකොබ් තුමන් විසින් ලියන ලද හසුනෙන් කොටසකි.

**"ඉවසිලිමත්ව ඔබේ සිත් තිරසර ව තබා ගන්න සමිඳාණෝ නොපමාව වඩින සේක."**

සහෝදරයෙනි, සමිඳාණන් වහන්සේගේ ආගමනය දක්වා ඉවසිල්ලෙන් සිටින්න. පළමු සහ අන්තිම වර්ෂාව වහින තුරු ගොවියා පොළොවේ සරුසාර පලදාව ගැන ඉවසිල්ලෙන් බලා සිටියි. එසේ ම ඔබ ද ඉවසිල්ලෙන් සිටින්න; ස්වාමින් වහන්සේගේ ආගමනය දැන් ළං ව ඇති බැවින් ඔබේ සිත් තිරසර ව තබාගන්න.

සහෝදරයෙනි, ඔබ විනිශ්චයට ලක් නොවන පිණිස එකිනෙකාට විරුද්ධ ව චෝදනා නොකරන්න. මෙන්න, විනිශ්චය-කාරයාණෝ දොරකඩ සිටින සේක. සහෝදරයෙනි, ස්වාමින් වහන්සේගේ නාමයෙන් කතා කළ දිවැසිවරයන්ගේ පීඩා විඳීම ද ඉවසීම ද ආදර්ශයට ගන්න.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** ඉසයියස් 68:1

ආලේලූයා! ආලේලූයා!
දෙවි සමිඳුන්ගේ ආත්මානුභාවය මා කෙරෙහි පිහිටා ඇත.
දිළිඳුන්ට සුබ අස්න දෙසීමට එතුමාණෝ මා ආලේප කළ සේක.
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** මතෙව් 11:2-11

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**වඩින්නට සිටින උතුමාණෝ ඔබ ද? නොහොත් අප වෙන කෙනෙකු ගැන බලා සිටිය යුතුද?**

ක්‍රිස්තුන් වහන්සේගේ මෙහෙය ගැන හිරගෙයි දී ජුවාම් හට ආරංචි වී, "එන්න සිටින තැනැත්තේ ඔබ ද? නොහොත් අප වෙන කෙනෙකු ගැන බලා සිටිය යුතු ද"යි ඇසීමට ඔහු සිය ගෝලයන් උන් වහන්සේ වෙත යැවී ය. ජේසුස් වහන්සේ උත්තර දෙමින්, "ඔබ ගොස් අසන දකින දේ ජුවාම් හට දන්වන්න. අන්ධයෝ පෙනීම ලබති; කොරු ඇවිදිති; ලාදුරු රෝගීහු පවිත්‍ර කරනු ලබති; බිහිරන්ට ඇසෙයි; මළාහු නැඟිටුවනු ලබති; දිළිඳුන්ට සුබ අස්න ප්‍රකාශ කරනු ලැබේ. මා කෙරෙහි විශ්වාසය නැති කර නොගන්න තැනැත්තේ භාග්‍යවන්තයෙකි"යි ඔවුන්ට වදාළ සේක. ඔවුන් යද්දී ජේසුස් වහන්සේ ජුවාම් ගැන සමූහයාට කතා කරන්න පටන්ගෙන, මෙසේ වදාළ සේක: "ඔබ කුමක් බලන පිණිස පාළුකරයට ගියහු ද? සුළඟින් සැලෙන බට ගසක් ද? නැතහොත් කුමක් බලන්න ගියහු ද? පට පිළියෙන් සැරසුණු මනුෂ්‍යයෙක් ද? බලන්න, පට පිළියෙන් සැරසුණු අය රජ මැදුරුවල සිටිති. එහෙත්, කුමක් සඳහා පිටත් ව ගියහු ද? දිවැසිවරයෙකු බලන පිණිස ද? එසේය යි මම ඔබට කියමි. දිවැසිවරයෙකුටත් වඩා බොහෝ උතුම් කෙනෙකු බලන පිණිස ය. මන්ද, කීවොත්:

'මෙන්න, මාගේ දූතයා ඔබට පෙරටුව යවමි, හෙතෙම ඔබ වඩිනා මඟ ඔබ ඉදිරියෙහි පිළියෙළ කරන්නේ ය'යි ලියා තිබෙන්නේ මොහු ගැන නිසා ය.

සැබැවින් ම මම ඔබට කියමි, මුළු මිනිස් සංහතිය තුළ ජුවාම් වඩා උතුම් කෙනෙක් පහළ නො වී ය. එහෙත් ස්වර්ග රාජ්‍යයෙහි ඉතා සුළු තැනැත්තේ වුව ද, ඔහුට වඩා උතුම් ය.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.